ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දීය උප ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය (2026 අප්‍රේල් 19-20)</u>**

ඉන්දීය උප ජනාධිපති ගරු ශ්‍රී සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා 2026 අප්‍රේල් 19-20 දිනවල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංචාරයක නිරත වනු ඇත. මෙය ඉන්දීය උප ජනාධිපතිතුමාගේ පළමු ද්විපාර්ශ්වික ශ්‍රී ලංකා සංචාරය වේ.

2. මෙම සංචාරය අතරතුර දී ගරු උප ජනාධිපතිතුමා ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා හමු වනු ඇත. එසේම, එතුමා ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය ගරු හරිනි අමරසූරිය මැතිනිය මෙන්ම වෙනත් සම්භාවනීය පුද්ගලයන් සහ ඉන්දීය ඩයස්පෝරා නායකයන් හමු වනු ඇත.

3. ශ්‍රී ලංකාව ඉන්දියාවේ මහාසාගර් (MAHASAGAR) දැක්ම සහ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය තුළ ඉතා වැදගත් සහකරුවෙකු වේ. ගරු උප ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය මෑත කාලීනව දෙරට අතර සිදු වූ ඉහළ මට්ටමේ නියැලීම්වලින් අනතුරුව සිදු වන අතර එය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සම්බන්ධ කරන සහස්‍ර වර්ෂ ගණනාවක් ඉපැරණි ජනතා සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

***

කොළඹ
***2026 අප්‍රේල් 17***

මූලාශ්‍රය:
https://www.mea.gov.in/press-releases.htm?dtl/41050/Visit_of_Vice_President_of_India_to_Sri_Lanka_April_1920_2026